Article 12(1)


ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව
இலங்கை மனித உரிமைகள் ஆணைக்குழு
**HUMAN RIGHTS COMMISSION OF SRI LANKA**


| මගේ අංකය<br>எனது இல.<br>My No. | ඔබේ අංකය<br>உமது இல.<br>Your No. | දිනය<br>திகதி<br>Date | 2018/06/19 |
|---|---|---|---|

| | | |
|---|---|---|
| පැමිණිලිකරු | : | ඒ.පී.ඩී.එස්. අත්තරගම මයා,<br>6/2, කේම්බ්‍රිජ් පෙදෙස,<br>කොළඹ 07. |
| වගඋත්තරකරුවන් | : | 01 විදුහල්පති,<br>රාජකීය විද්‍යාලය,<br>කොළඹ 07.<br><br>02 ලේකම්,<br>අධ්‍යාපන අමාත්‍යාංශය,<br>ඉසුරුපාය,<br>බත්තරමුල්ල. |

<u>පැමිණිලි අංකය</u> : **<u>HRC/197/18</u>**

පැමිණිල්ල:-

ඉහත පැමිණිලිකරු විසින් මානව හිමිකම් කොමිෂන් සභාව හමුවේ පැමිණිල්ලක් ගොනු කරමින් සදහන් කර ඇත්තේ තම දෙවන දරුවා වන දිනත් හිරුණික අත්තරගම දරුවාව 2018 වසරේ පළමු ශ්‍රේණියට සහෝදර පදනම මත කොළඹ රාජකීය විද්‍යාලයට ඇතුළත් කිරීම සඳහා අයදුම් පත්‍ර ඉදිරිපත් කිරීමෙන් අනතුරුව 2017-08-23 වන දින සම්මුඛ පරීක්ෂණ මණ්ඩලයට පෙනී සිටි බවයි. එහිදී අංක 22/2017 දරණ චක්‍රලේඛයේ ප්‍රකාර ඡන්ද හිමි නාම ලේඛනයේ ලියාපදිංචි වී තිබීම නිසා වර්ෂයකට එක් අයෙකුට ලකුණු 2 බැගින් 2012, 2013, 2014, 2015, 2016 යන වර්ෂ පහ සඳහා ලකුණු 20 ක්ද, පදිංචි ස්ථානයේ සිට පාසලට ඇති ආසන්නතාවය සඳහා උපරිම ලකුණු වන ලකුණු 30 ක්ද, ලබා දීමෙන් අනතුරුව ලියාපදිංචි නොකළ බදු ඔප්පුව ඉදිරිපත් කිරීම හේතුවෙන් ඉන් ඉදිරියට ලේඛන පරීක්ෂා කිරීම නැවතී සම්මුඛ පරීක්ෂණ මණ්ඩලය විසින් තම




ප්‍රධාන කාර්යාලය / பிரதான அலுவலகம் / Head Office: **14, ආර්. ඒ. ද මෙල් මාවත, කොළඹ - 04.** 14, ஆர்.ஏ.த. மெல் மாவத்தை, கொழும்பு - 04. 14, R. A. De Mel Mawatha, Colombo - 04.
සභාපති / தவிசாளர் / Chairperson: 011-2505451
ෆැක්ස් / தொலைநகல் / Fax: 011-2505541/74
ඊමේල් / மின்னஞ்சல் / e-mail: sechrc@sltnet.lk

ලකුණු ප්‍රමාණය බින්දුව (0) කර ඔහුගේ අයදුම් පත්‍රය ප්‍රතික්ෂේප කරන ලද බවද සඳහන් කර ඇත.

ඒ අනුව තම දරුවා සහෝදර පදනම මත 2018 වර්ෂයේ පළමු ශ්‍රේණිය සඳහා කොළඹ 07 රාජකීය විද්‍යාලයට ඇතුලත් කර දෙන ලෙසට මෙම පැමිණිල්ල මගින් ඉල්ලා සිට ඇත.

මෙම පැමිණිල්ලට අදාලව දෙපාර්ශවය කොමිෂන් සභාව වෙත කැඳවා සිදුකරන ලද 2018-02-27 දිනැති පරික්ෂණයේදී පැමිණිලිකරු තවදුරටත් කියා සිට ඇත්තේ, අධ්‍යාපන අමාත්‍යාංශයේ 2017-05-30 දින සහ අංක 22/2017 චක්‍රලේඛ යටතේ පදිංචිය සඳහා ලියාපදිංචි කරන ලද බදු ඔප්පුවක් තිබීම අනිවාර්ය බව කිසිම තැනක ගම්‍ය නොවූ හෙයින් මෙම ලියාපදිංචි නොකරන ලද බදු ඔප්පුව සහිත අයදුම්පත ලියාපදිංචි තැපැල් මගින් තැපැල් කර යවන ලද බවයි.

තවද පැමිණිලිකරු ලියාපදිංචි කරන ලද බදු ඔප්පුව අනිවාර්ය බවට දැනගැනීමෙන් පසු එම ලියාපදිංචි නොකරන ලද බදු ඔප්පුවේම මුල් පිටපත කොළඹ ඉඩම් රෙජිස්ට්‍රාර් කාර්යාලය වෙත ලියාපදිංචිය සඳහා 2017 ජූනි මාසයේදී භාර දී ඒ අනුව 2017-08-23 වන දින පැවති සම්මුඛ පරීක්ෂණය සඳහා පෙනී සිටි බවද සඳහන් කර ඇත. තවද ඉහත කී අධ්‍යාපන අමාත්‍යාංශයෙන් නිකුත කළ 22/2017 චචක්‍රලේඛනයෙන් පසුව 2017-07-31 දිනැති අංක 22/2017 (1) චක්‍රලේඛනයෙන් 22/2017 චක්‍රලේඛනයේ උප වගන්ති 7. 1 .3 සම්පූර්ණයෙන් ඉවත් කරනු ලැබ ඇති බව අධ්‍යාපන අමාත්‍යාංශයේ ලේකම් සියළු අධ්‍යාපන බලධාරීන්ට හා සියලුම පාසැල් විදුහල්පතිවරුන්ට දන්වා එවා ඇති බවද ඒ අනුව තම අයදුම්පත කිසිදු ලකුණක් ලබාදීමකින් තොරව ප්‍රතික්ෂේප කර ඇති බවද සඳහන් කර ඇත.

එසේම මෙම ලියාපදිංචි කරන ලද අංක 1901 දරණ බදු ඔප්පුව පැමිණිලිකරුගේ අතට ලැබෙන්නට පෙර සම්මුඛ පරීක්ෂණ මණ්ඩලයේ කාර්ය භාරය අවසන් වී ඇති බවත් ඔහු එම ලියාපදිංචි බදු ඔප්පුව සමග 2017-12-11 වන දින අභියාචනා මණ්ඩලය සඳහා පෙනී සිටින ලද බවත්, එම අභියාචනා මණ්ඩලයේදී පැමිණිලිකරුගේ ලිපි ලේඛන පරීක්ෂා කිරීමකින් තොරව සම්මුඛ පරීක්ෂණ මණ්ඩලය විසින් ලද තීන්දුව තවදුරටත් තහවුරු කර ඇති බවත් පැමිණිලිකරු සඳහන් කර ඇත.

මෙම 22/2017 චක්‍රලේඛනය සහ ඉන් අනතුරුව නිකුත් වී තිබූ 22/2017 (1) චක්‍රලේඛනයට සමගාමීව අධ්‍යාපන අමාත්‍යාංශයේ ලේකම්වරයා විසින් 2017-09-19 වන දින සියලුම විදුහල්පතිවරුන් වෙත නිකුත් කරන ලද <u>ඊඩී/01/12/09/04/03(1)</u> ලිපියට අනුව මූලික අවශ්‍යතාවය සම්පූර්ණ කරන්නේ නම් එක් කරුණක් සඳහා ලකුණු සමස්ථ වශයෙන් බින්දුව

කිරීම තුළ අයදුම්පත් ප්‍රතික්ෂේප කිරීම සාධාරණ නොමැති බව පැමිණිලිකරු තවදුරටත් සඳහන් කර ඇත.

වගඋත්තර පාර්ශවයේ කරුණු දැක්වීම :-

පරීක්ෂණය සඳහා සහභාගි වූ වගඋත්තරකාර පාර්ශවය විසින් කරුණු ඉදිරිපත් කරමින් සඳහන් කර ඇත්තේ, මෙම ගණය යටතේ අයදුම් පත්‍රය ඇගයීම සඳහා,

01 පාසලට අදාල පෝෂිත ප්‍රදේශය තුළ අයදුම්කරු ස්ථිර පදිංචිකරුවෙකු වීමත්.

02 අයදුම්කරුගේ වෙනත් පුත්‍රයෙකු පාසලේ සිසුවෙකු ලෙස ලියාපදිංචි කර තිබීමත් යන සුදුසුකම් අවශ්‍ය වන බවයි.

තවද 22/2017 චක්‍රලේඛනය යටතේ පදිංචිය තහවුරු කිරීම සඳහා පිළිගත හැකි ලේඛන ලැයිස්තුවක් සඳහන් කර ඇති අතර එකී ලැයිස්තුවේ ලියාපදිංචි නොකළ බදු ඔප්පුව ප්‍රකාශිත වීම ඉවත් කොට ඇති බවත් සඳහන් කර ඇත. ඒ අනුව සම්මුඛ පරීක්ෂණ මණ්ඩලය විසින් ලියාපදිංචි නොකළ බදු ඔප්පුව සලකා බැලීමක් සිදුවී නොමැති බවත් මෙම පැමිණිලිකරු ලියාපදිංචි නොකළ බදු ඔප්පුව සම්මුඛ පරීක්ෂණ මණ්ඩලයට ඉදිරිපත් කිරීම තුළ ඔහුගේ අයදුම් පත්‍රය ප්‍රතික්ෂේප කර ඇති බවත් සඳහන් කර ඇත.

එසේම ලියාපදිංචි නොකළ බදු ඔප්පුව සඳහා අදාළ ලකුණු ප්‍රමාණය ලබා නොදී අනෙකුත් කාණ්ඩ යටතේ ලබා දියහැකි ලකුණු ප්‍රමාණයත් ඔවුන් හට දියයුතු බව පැමිණිලිකරු නැගූ ප්‍රශ්නයට පිළිතුරු වශයෙන් වගඋත්තරකරු ප්‍රකාශ කර ඇත්තේ මෙම ගණය යටතේ අයදුම්කරුවන් මූලික සුදුසුකම ඉටු නොකිරීම යන පදනම මත මෙම අයදුම්පත්‍ර ප්‍රතික්ෂේප කොට ඇති බවත් ඒ අනුව අනු කාණ්ඩ වලට ලකුණු ලබා දීම සිදු නොකර ඇති බවත්ය. තවද 22/2017 චක්‍රලේඛයට කරන ලද සංශෝධන ප්‍රකාර මූලික සුදුසුකම් සම්පූර්ණ කොට නොමැති අවස්ථාවක අනෙකුත් කාණ්ඩ සඳහා ලකුණු ලබාදීමට අවස්ථාව සලසා දී තිබූ වගන්තිය ප්‍රකාශිතවම ඉවත් කොට ඇති බවත් ඒ අනුව සම්මුඛ පරීක්ෂණ මණ්ඩලය විසින් නිවැරදිව අයදුම්පත්‍ර ඇගයීමට ලක් කර ඇති බවත් පසුව ඉදිරිපත් කර ඇති ලියාපදිංචි බදු ඔප්පු අභියාචනා මණ්ඩලයට සලකා බැලීමට චක්‍රලේඛය මගින් ප්‍රකාශිතවම තහනම් කොට ඇති බවත් සඳහන් කර ඇත.

තිරීක්ෂණ :-

පැමිණිලිකරුගේ මූලික පැමිණිල්ලේ අඩංගු කරුණු කාරණා සහ පරීක්ෂණයේදී දෙපාර්ශවය විසින්ම ඉදිරිපත් කරන ලද වාචික හා ලිඛිත ප්‍රකාශ කෙරෙහි අවධානය යොමු කිරීමේදී මෙම පැමිණිලිකරු සිය දරුවා වන දිනත් හිරුණික අත්තරගම දරුවා කොළඹ රාජකීය විද්‍යාලයේ 2018 වසරේ පළමු ශ්‍රේණියට සහෝදර පදනම යටතේ ඇතුළත් කිරීම සඳහා අයදුම් පත්‍ර ඉදිරිපත් කිරීමෙන් අනතුරුව සම්මුඛ පරීක්ෂණයට සහභාගී වී ඇති අතර එහිදී පැමිණිලිකරුගේ ලේඛන පරීක්ෂා කිරීමෙන් අනතුරුව ලියාපදිංචි නොකළ බදු ඔප්පුවක් ඉදිරිපත් කිරීමේදී එම කාරණාව පදනම් කරගෙන පැමිණිලිකරුගේ අයදුම් පත්‍රය සම්පූර්ණයෙන්ම ලකුණු ලබා නොදී ප්‍රතික්ෂේප කිරීමට සම්මුඛ පරීක්ෂණ මණ්ඩලය විසින් කටයුතු කර ඇත. ඉන් අනතුරුව පැමිණිලිකරු 2017-12-11 වන දින පැවති අභියාචනා මණ්ඩලයේදී සම්මුඛ පරීක්ෂණ මණ්ඩලයේදී ඉදිරිපත් කළ ලියාපදිංචි නොකළ එම බදු ඔප්පුවේම ලියාපදිංචි කළ බදු ඔප්පුව ඉදිරිපත් කර ඇත.

කෙසේ වෙතත් අභියාචනා මණ්ඩලයේදී එම ලියාපදිංචි කළ බදු ඔප්පුව සැලකීමට ගෙන නොමැති අතර සම්මුඛ පරීක්ෂණ මණ්ඩලය විසින් ලබා ගන්නා ලද තීන්දුව තවදුරටත් තහවුරු කර ඇත.

මෙහිදී සහෝදර පදනම මත පළමු ශ්‍රේණියට ළමුන් ඇතුළත් කිරීමේදී පදිංචිය තහවුරු කිරීම සඳහා ඉදිරිපත් කරන ලේඛන අතර ලියාපදිංචි කළ බදු ඔප්පුවක් අනිවාර්යයෙන් තිබිය යුතු කරුණක් ද යන්න සම්බන්ධයෙන් සළකා බැලීමේදී, 2018 වසරේ පළමු වන ශ්‍රේණියට ළමුන් ඇතුළත් කිරීම සඳහා අධ්‍යාපන අමාත්‍යාංශයේ ලේකම්වරයා විසින් නිකුත් කර ඇති 2017.05.30 දිනැති හා අංක 22/2017 දරණ චක්‍රලේඛනයේ 7.1.3 වගන්තිය අනුව, **"මෙම ගණ සඳහා ලකුණු ක්‍රමයකට අනුව ලකුණු ලබා දෙන හෙයින් ලකුණු දීමේ පටිපාටියේ එක් කොටසකට ලකුණු ලබා නොගත්ත ද ලකුණු හිමිවන අනෙකුත් කොටස් සඳහා ලකුණු ලබා දියයුතු අතර එවැනි අවස්ථා වල එම ගණය සඳහා සම්පූර්ණයෙන්ම ලකුණු ලබාදීම ප්‍රතික්ෂේප නොකළ යුතුය."** වශයෙන් දක්වා ඇත.

කෙසේ වෙතත් නැවතත් 2017-07-01 දිනැතිව අංක 22/2017(1) චක්‍රලේඛය අධ්‍යාපන අමාත්‍යාංශයේ ලේකම්වරයා විසින් සියලුම පාසැල් විදුහල්පතිවරුන් වෙත නිකුත් කර ඇති අතර, එම චක්‍රලේඛය අනුව ඉහත කී 22/2017 චක්‍රලේඛයේ 7.1.3 උප වගන්තිය සම්පූර්ණයෙන් ඉවත් කර ඇති බවට දක්වා තිබීම හේතුවෙන් පැමිණිලිකරු සම්මුඛ පරීක්ෂණ මණ්ඩලයට ඉදිරිපත් වූ අවස්ථාව වනවිට සම්මුඛ පරීක්ෂණ මණ්ඩලය විසින් පැමිණිලිකරුගේ අයදුම් පත්‍රය සම්පූර්ණයෙන්ම ඉවත් කිරීමට නීතියෙන් අවස්ථාවක් ලැබී තිබූ බවට තිරීක්ෂණය වුවද අධ්‍යාපන අමාත්‍යාංශයේ ලේකම්වරයා විසින් 2017-09-19 වන දින සියලුම පාසැල් වල විදුහල්පතිවරුන් වෙත නිකුත් කර ඇති ලිපියෙහි දෙවන ජේදය කෙරෙහි අවධානය යොමුකිරීමේදී **"පළමු වන ශ්‍රේණියට ළමයින් ඇතුළත් කිරීමට අදාළ 2017-05-30 දිනැති 22/2017 චක්‍රලේඛය සම්බන්ධයෙන්**

විවිධ පාර්ශව වලින් තවදුරටත් ඉදිරිපත් වූ අදහස් හා යෝජනා අනුව 22/2017(1) චක්‍රලේඛනය මගින් සංශෝධන සිදු කර ඇත. මෙම සංශෝධන අනුව චක්‍රලේඛයේ 7.1.3 උප වගන්තිය ඉවත් කර ඇතත්. එක් එක් ගණයන් යටතේ නිර්නායකයන්ට හිමිවන ලකුණු සම්පූර්ණයෙන් ප්‍රතික්ෂේප කළ යුතුය යන්න එමගින් ගම්‍ය නොවේ." වශයෙන් දක්වා ඇත. තවද එම ලිපියේ 3 වන ඡේදයට අනුව "22/2017 චක්‍රලේඛයේ අදාළ ගණයන් හය සඳහා මූලික සුදුසුකම් හඳුන්වා දීමෙන් අනතුරුව ඒ ඒ ගණයට අදාළ ලකුණු පටිපාටිය දක්වා ඇත. යම් අයදුම්කරුවෙකු එම මූලික සුදුසුකම් සපුරා නොමැති නම් පමණක් අදාළ ගණයට හිමිකම් නොලබයි. එහෙත් නියමිත මූලික සුදුසුකම් සපුරා ඇත්නම් ලකුණු පටිපාටියේ එක් එක් කොටසක් තහවුරු නොකිරීම මත සම්පූර්ණයෙන් ලකුණු ලබාදීම ප්‍රතික්ෂේප නොකළ යුතුය." යනුවෙන් දක්වා ඇත. පැමිණිලිකරු සහෝදර පදනම යටතේ අයදුම්කිරීමට අවශ්‍ය මූලික සුදුසුකම සපුරා ඇත.

ඒ අනුව මෙම ලිපිය 2017-09-19 වන දින නිකුත් කර ඇති අතර. අභියාචනා මණ්ඩලය පවත්වා ඇත්තේ 2017-12-11 වන දිනදී වන බැවින් මෙම ලිපියේ ඉහත කී ඡේද දෙකෙන්ම සඳහන් වූ ආකාරය අනුව එනම් අභියාචනා මණ්ඩලයේ සාමාජිකයින් එක්ව් පරීක්ෂණය පැවැත්වීමට පෙර මෙම ලිපිය නිකුත් කර ඇති බව නිරීක්ෂණය වනබැවින් මෙම ලිපියට අභියාචනා මණ්ඩලය අවධානය යොමු කර තිබේ නම් මෙම පැමිණිලිකරුගේ දරුවාව ඉහත කී පාසලට ඇතුළත් කළයුතු බව ඉතා පැහැදිලි වේ. තවදුරටත් එයට හේතුවී ඇත්තේ ඉහත කී චක්‍රලේඛ දෙකෙන්ම නිකුත් කර අත්සන් තබා තිබූ අධ්‍යාපන අමාත්‍යාංශයේ එම ලේකම්වරයා වෙතින්ම මෙම ලිපිය නිකුත් වී තිබීම හා එම ලිපිය පාසැල් විදුහල්පතිවරුන් විසින් පිළිගැනීම කළයුතු වීමත්ය.

තවද මෙම සහෝදර ගනය යටතේ ඉහත කී පාසලට ළමුන් ඇතුළත් කිරීමේ අවම ලකුණු වී ඇත්තේ ලකුණු 28 ක් බවත් පෙත්සම්කරුට චක්‍රලේඛනය ප්‍රකාරව ලකුණු ලබාදී තිබේ නම්.

| | |
|---|---|
| ඡන්ද හිමි නාම ලේඛනයට | ලකුණු 20 |
| පදිංචි ස්ථානයේ සිට පාසලට ඇති ආසන්නතාවය | ලකුණු 30 |
| අදාළ පාසලේ ඉගෙනුම ලබන සහෝදරයා වෙනුවෙන් | ලකුණු 12 |
| අදාළ පාසලේ ඉගෙනුම ලබන සහෝදරයා එම පාසලේ පළමු ශ්‍රේණියට ඇතුළත්ව දැනට ඉගෙනුම ලැබීම | ලකුණු 5 |
| එකතුව | ලකුණු 67 වශයෙන් ලකුණු ලබා |

දියයුතුව ඇති බවද නිරීක්ෂණය වේ.

නිගමනය :-

මේ අනුව පැමිණිලිකරු මුල් අවස්ථාවේදී ලියාපදිංචි නොකළ බදු ඔප්පුව සම්මුඛ පරීක්ෂණ මණ්ඩලයට ඉදිරිපත් නොවීම තුළ අයදුම්පත ප්‍රතික්ෂේප වූ නමුත් අභියාචනා මණ්ඩලයේදී එම

ඔප්පුව ලියාපදිංචි වී තිබීම මත සහ අධ්‍යාපන අමාත්‍යාංශයේ ලේකම්වරයා විසින් 2017-09-19 වන දින සියලුම පාසැල් විදුහල්පතිවරුන් වෙත නිකුත් කළ අංක ඊඩී/01/12/09/04/03(1) ලිපියේ දෙවන හා තෙවන ඡේදය ප්‍රකාරව පැමිණිලිකරුට ලියාපදිංචි නොකළ බදු ඔප්පුවට ලකුණු ලබා නොදී අනෙකුත් ලේඛන වලට චක්‍රලේඛනය ප්‍රකාරව ලකුණු ලබා දියයුතු වන අතර පැමිණිලිකරුගේ අයදුම්පත්‍රය සහෝදර පදනම මත බැවින් සහෝදර පදනම මත අයදුම්පත්‍රය ඉදිරිපත් කිරීමට ඇති මූලික අවශ්‍යතාවය වන්නේ පැමිණිලිකරුගේ වැඩිමහල් පුත්‍රයා එම පාසලේ ඉගෙනීම ලැබීම වේ.

මෙකී සමස්ථ කරුණු අනුව. 1978 ශ්‍රී ලංකා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 3 වන පරිච්ඡේදයේ 12(1) වන ව්‍යවස්ථාව ප්‍රකාරව වගඋත්තර පාර්ශවය විසින් පැමිණිලිකරුගේ මූලික අයිතිවාසිකම් උල්ලංඝනය වන ආකාරයෙන් කටයුතු කර ඇති බවට මෙයින් නිගමනය කරනු ලැබේ.

නිර්දේශය :-

ඒ අනුව පැමිණිලිකරුගේ දරුවා වන දිනත් හිරුණික අත්තරගම දරුවාව කොළඹ රාජකීය විද්‍යාලයේ 2018 වසරේ පළමු ශ්‍රේණියට ඇතුළත් කිරීම සඳහා කටයුතු කළයුතු බවට මෙයින් නිර්දේශ කරනු ලැබේ.

මෙම නිර්දේශය අනුව කටයුතු කර 2018.07.19 වන දිනට පෙර වාර්තාවක් කොමිෂන් සභාවට ලැබීමට සලස්වන ලෙස 1996 අංක 21 දරණ ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභා පනතේ 15 වන වගන්තිය ප්‍රකාරව වගඋත්තරකරුවන් වෙත දන්වා සිටිමු.

එසේම එකී නිර්දේශය ක්‍රියාත්මක වීම හෝ නොවීම සම්බන්ධව පැමිණිලිකරු විසින්ද ඉහත දින සිට සතියක කාලයක් තුළ කොමිෂන් සභාවට දැනුම්දිය යුතු වන අතර. එදිනට පෙර අදාළ දැනුම්දීම සිදු නොකරන්නේ නම් පසුව ඉදිරිපත් කරනු ලබන ඉල්ලීම් සම්බන්ධයෙන් සලකා නොබලන බවද වැඩිදුරටත් දන්වා සිටිමු.

කොමසාරිස්.
ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව.

**Commissioner**
Human Rights Commission of Sri Lanka
No. 14, R.A. De Mel Mawatha,
Colombo 04.

කොමසාරිස්.
ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව.

**Commissioner**
Human Rights Commission of Sri Lanka
No. 14, R.A. De Mel Mawatha,
Colombo 04.

B/R-7